පාසැල් අධ්‍යාපන කටයුතු ඉවරවූ සැනින් ගාල්ලෙ උන්නු මිතුරන් තුන් දෙනෙකුට හිතුනේ අළුත්ම තාලේ වැසඩකට අතහසන්නටයි. නුවන් චින්තන මුදිත වෙලා හිරාන් චන්ද්‍රසේනත්, නුවන් තමිරත් එකතු කර ගන්නවා ගීත ලෝකිනට. ගීත ලෝකයට නිර්මාණ කරුවනට නව ආරාධ වෙබ් අඩවියක් සකස් කරන්නට. ඔවුනගේ අදහස සාර්ථකයි.

නුවන් චින්තනගේ අධීක්ෂණයෙන් GALLE ZONE නමින් අන්තර්ජාලයට මුදාහැරෙනවා මේ වෙබ් අඩවිය. දිනෙන් දින එකිනෙකා අතර නුවමාරු කරගනිමින්, අස්සක් මුල්ලක් හෑර ප්‍රචලිත වන මේ වෙබ් අඩවිය සාර්ථකවූ පසුබිමක් සකස් කරනවා. හැබැයි කිසිම නිර්මාණකරුවකුගෙන් මුදලක් නම් අය කරල් නැහැ. දැනටත් එහෙම ම තමයි. ඉන්න ඔය කාලේදී නවත් වෙනසකට මේ වෙබ් අඩවිය මුල් වෙනවා. MUSIC.LK නමින් නවත් විශේෂාංගයන් ගෙන් සපිරි ව නවතාවයක් ගන්නට.

අද දවස වෙනකොට මුළු ලොව පුරා සම්පූර්ණ සැළසුම් කරන්න වෙබ් අඩවියක් MUSIC.LK මෙයේ දුර ගමනක් ජන්නට හිටුනා ගේ උත්සාහය එකක් නිසාම මේ සාර්ථකත්වයේ ලකුණක් කියන්නට ප්‍රමාණ. ඉතාත්මකතාවයන් ඉදිරිය ගමනයන්ට අද MUSIC.LK කණ්ඩායම ගන්නා පියවර ප්‍රසංසනීයයි. 2009 අලුරුදු‍ද් දී ලංකාවේ හොඳ ම වෙබ් අඩවිය හිමි සම්මානයත් ද රැගෙන තව තවත් අසවි කරා අවදන්නට මූ ඔවුනගේ ගමන සාර්ථකයි.

පියෝ වීඩියෝ හරහා ඩිම් වීඩියෝ නමින් රූපවාහිනී නාලිකාවක් ද ආරම්භ කරන්නට ඔවුනට අවසරය ලැබෙනවා. එපමණක් ම නොවේ සංගීතයට අදාළව CONTENT MANAGEMENT සිදුවීම. මේ ගීතේ ඩවුන් මෝෂන්, මූ ලියුඩි හා වැලි සංදේශ ආයතනයන් ගේ පාරිශෝධකරුවන් ලෙස කටයුතු කරනවා. මේ නිලධාරීන් ම අදාළ නිර්මාණකරුවන් ගේ නිර්මාණලෙස,ඉදිරියේ දේපොල පළල පවිත්‍රතයේ දැමින් නිර්මාණකරුවාගේ ප්‍රතිරූපය ලොවටම හැඳින්වැදීමයි.

අන්තර්ජාලයත් ගීයත් අතර පවතින්නේ වෙන් නොවළ හැකි බැඳීමක්. එනිසාම MUSIC.LK වෙබ් අඩවිය මගින් ගීතයක් ප්‍රචාරයක්‍ය වන්නට මූ අවකාශය ඔබාගනිමි. DIGITAL මාධ්‍ය තුළින් ගීතයේ ප්‍රචාරයට ලැබෙන ඉඩකඩ ඔබාගනිම ඉතාමයි. විශේෂයෙන්ම ගීත නිර්මාණකරුවන්ව පැසී ආදායමක් ලබාගන්නට හැකි බැවයි නුවන් චින්තනගේ අදහස.

ජාගෝලීව මේ යන ගමනේ තවත් ඉසව්වක් ද ඔවුන් තතු කරගනු ලැබුවා. එනම් GOOGLE සමාගමත් සමග RIPPLE OF MUSIC කියන Hangout Project එක. GOOGLE කියමු ව්‍යාපාරියක්‍ය ඔවුන් අති සාර්ථකව කළා. ඒ නිසාම YOU TUBE හා අන්තර්ජාල බැඳගැනීම MUSIC.LK සඳ විශාල ජාලගතයක්. කාල්ලෙන් පටන් ගත් ගමන් මග ලොව පුරා විසිරිලා. MUSIC.LK සමග අන්තර්ජාල බැඳගත් ජාතකාන්තර වැදැලි සංදේශ ආයතන වෙනම අනුගතය හවතකගේ රසකුමද ඔබාගනිමි.

14 වන පිටෙන්

පොලිසිය ඔබගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරමින් ඉදිරිපත් කර ඇති හේතු පිළිබඳ ඔබගේ අදහස මොකක්ද?

අපි හොඳටම දන්නවා අද සමාජයේ දේශපාලකයන්ගේ බිරින්දලාත් දේශපාලකයන්ගේ බලය භාවිතා කරනවා. පොලිස් නිලධාරීන්ගේ බිරින්දොත් ඔහේ තරම් ඒ විදිහට කරනවා. වෙනත් දෙපාර්තමේන්තුවල ලොකු ලොක්කන්ගේ බිරින්දලත් සමහර වෙලාවට ඒ දේම කරනවා. අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ බිරින්දලාත් මේ මම අහවල් අමාත්‍යාංශයේ ලේකම්ගේ හෝනා කියලා ඒ බලය භාවිතා කරනවා. මේ චිත්‍රපටියේ එක දර්ශනයක් තියනවා බිරිය භාවිතා කරනවා පොලිස් නිලධාරියාගේ බලය. මේක සාමාන්‍ය දෙයක්. මෙය දෙපාර්තමේන්තුවේ අභිමානයට සහ කීර්ති නාමයට කැළලක් විය හැකියි කියා පොලිසිය කියනවා.

පොලිසිය කියනවා මේ චිත්‍රපටිය රූගත කිරීම සුදුසු නොවන බව දන්වනවා කියලා. මට තියන ප්‍රශ්ණය පොලිසියේ පුද්ගලයෙක් දෙන්නෙක් කොහොමද චිත්‍රපටියක් රූගත කිරීම සුදුසුද නැත්ද කියා තීරණය කරන්නේ. ඒ වගේම මේක 'පොලිස් දෙපාර්තමේන්තුවට අපහාසයක් විය හැකි බවටත්' කියා කියන්නේ සිතිත් මවාගත් දෙයක්. එහි පොලිසියට අපහාසයක් තියනවා නම් එවැන්නක් තිබන බව සෑපුව කිව හැකියි. එහෙත් එහෙම කියලා නෑ. මේ වගේ හිතලු මත කලා නිර්මාණයක් පිළිබඳ තීන්දු තීරණ ප්‍රකාශ කිරීම මම හිතන්නේ නිර්මාණකරුවන්ට කරන අසාදාරණයක්.

පොලිසියේ සහාය නැතිව චිත්‍රපටිය රූගත කිරීමේ හැකියාවක් නැත්ද?

පොලිස් දෙපාර්තමේන්තුව කියන කොට මේ චිත්‍රපටිය රූගත කිරීම සුදුසු නෑ කියලා මම කොහොමද කැමරාවක් අරගෙන පාරට බහින්නේ. මමත් මගේ නිෂ්පාදන කණ්ඩායමත් ඉතාම අසරණයි. එනිසා අපි ඉතාම අකමැත්තෙන් කම්පාවෙන් කණගාටුවෙන් චිත්‍රපටිය පැත්තකින් තියන්න සිදුවුණා.
දැන් මොකක්ද කරන්න බලාපොරොත්තු වන්නේ?
දැන් මම කල්පනා කරනවා ඉදිරියේදී මේ වගේ ප්‍රශ්ණ නැති චිත්‍රපටියක් හදන්නේ කොහොමද කියලා. ජාතක කතාවක්, ප්‍රේම කතාවක්, ලාභ සහ බාල ගණයේ විකිළු කතාවක්. එහෙම ඒවාට නම් ගැටළුවක් වෙන එකක් නෑ. කාගෙන්වත් ප්‍රශ්ණ නැති, පොලිස් නිලධාරියෙක් නැති, රජයේ නිලධාරියෙක් නැති, පූජකවරයෙක් නැති, දේශපාලකයෙක් නැති චිත්‍රපටි තමයි හදන්න වෙන්නේ. එහෙම නැතිව සමාජ යථාර්ථය ගැන කතා කරන චිත්‍රපටි හදන්න මේ විදියට තවදුරටත් හැකියාවක් නෑ. මීට පස-'සේ තිර පිටපතක් ලියන ඕනෑම නිර්මාණකරුවෙකුට කොහොමද ඒක ලියන්නේ කියලා දීර්ඝව කල්පනා කරන්න වෙනවා. පන්සිය පනස් ජාතකයෙන් වගේ පොලිස් නිලධාරීන් නැති කතාන්දරවලින් තමයි චිත්‍රපටි හදන්න වෙන්නේ.
මම හිතන්නේ සමස්ථ පොලිස් දෙපාර්තමේන්තුවට නම් මේකෙන් කිසිම ප්‍රශ්ණයක් නෑ. අවශ්‍ය නම් පොලිස් දෙපාර්තමේන්තුවට මේකෙන් ආදර්ශයක් ගන්න පුළුවන්. රහසින් වැරදි කරන මිනිහෙක් අනාවරණය කිරීම මගින් පොලිසියේ සෙසු නිලධාරීන්ට ආදර්ශයක් සහ දැස් පෑදීමක් වෙනවා.

මේ සම්බන්දයෙන් අභියාචනයක් ඉදිරිපත් කරන්න අදහස් කරන්නේ නැත්ද?

මම මේ ගැන සාමය සහ නීතිය අමාත්‍යාංශයේ ලේකම්වරයාට අභියාචනයක් ඉදිරිපත් කළා. 13 වෙනිදා ඉදිරිපත් කළේ. අද දක්වාත් ප්‍රතිචාරයක් නෑ. මම දැක්කා 'පොලිසියට මඩගහන චිත්‍රපටිවලට අපි සහාය දෙන්නේ නෑ' කියලා දිනපතා පත්තරේකට පොලිස් මාධ්‍ය ප්‍රකාශක මහත්තයා කියලා තියනවා කොස්තාපල් පුසද්සසෝම චිත්‍රපටිය නිසා පොලිස් දෙපාර්තමේන්තුවට විශාල අපහාසයක් වුණා. ඒ නිසා මේකට අවසර නොදෙන්න තීරණයක කළා කියලා. හැමෝම දැන් මගෙන් අහනවා කෝ චිත්‍රපටිය කියලා. එය රූගත කරන්න වෙන්කරගෙන තිබුණු තැන්වලින් අහනවා. මේ තියන තත්ත්වයත් එක්ක මට සිදුවෙච්ච අලාභය විදගෙන මේ කතාව නවකතාවක් වගේ දේකට පරිවර්තනය කරන්නයි මම හිතාගෙන ඉන්නේ. රටේ තියන්නේ මේ වගේ තත්ත්වයක් නම් මම හිතන්නේ නැහැ අපි වගේ නිර්මාණකරුවන්ට තවදුරටත් ඒ කටයුත්තේ යෙදෙන්න පුළුවන් වෙයි කියලා. අපි නිර්මාණ වශයෙන් හඳුනාගන්නේ ප්‍රශස්ති නොවෙයි. අවස්ථාවක් ලැබුණොත් යම් දවසක මේක චිත්‍රපටියක් ලෙස නිර්මාණය කෙරෙයි.

අවස්ථාවක් ලැබුණොත් කියන්නේ? එහෙම තත්ත්වයක් ඉබේ ඇතිවෙයිද? ඒ වගේ පැත්තකට රට ගමන් කරමින් සිටින බවක් පෙණෙනවාද?

රටක් හැමදාම එකම වගේ තියන එකක් නෑ. යම් දවසක රටට මාධ්‍ය නිදහසක්, නිර්මාණකරණයේ නිදහසක් ලැබෙන්න ඉඩ තියනවා. කලාකරුවෙක් හැටියට මම ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරනවා. නිවැරදි ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටක මාධ්‍ය නිදහස තියනවා. බය නැතිව තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න පුළුවන්. ලියන්න පුළුවන්. පොලිසිවලට, අධිකරණයට අනිසි බලපෑම් නෑ. ඒ ආයතන ස්වාධීනවයි කටයුතු කරන්නේ. හැමෝටම සාදාරණ සමාජයක් තියනවා. නිවැරදි ප්‍රජාතන්ත්‍රවාදී රටක් ඇතිවෙන දවසක තමයි අපිට නිදහසේ කලා නිර්මාණයක් කරන්න පුළුවන් වෙන්නේ.

සංවාදය සහ ඡායාරූප
ශ්‍රීලාල් සෙනෙවිරත්න